# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි ප්‍රථම පරීක්ෂණය (බාහිර) - 2022
2024 ඔක්තෝබර් / නොවැම්බර්

## සමාජීය විද්‍යා පීඨය

## දේශපාලන විද්‍යාව
(නව නිර්දේශය)

### ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රමය හා දේශපාලනය - POLS 18224

ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.

ප්‍රශ්න සංඛ්‍යාව : 09 යි. කාලය : පැය 03 යි.

---

01. ශ්‍රී ලංකාවේ දේශපාලන - සමාජ පරිවර්තන සම්බන්ධයෙන් හැරවුම් ලක්ෂයක් ලෙස කෝල්බෲක් - කැමරන් ප්‍රතිසංස්කරණ හැඳින්වීම කොතෙක්දුරට යුක්ති සහගතදැයි පරීක්ෂා කරන්න. (ලකුණු 20)

02. 19 වන ශතවර්ෂයේ දෙවන භාගයේ මෙරට ආගමික පුනර්ජීවන ව්‍යාපාරයේ ලක්ෂණ සාකච්ඡා කරන්න. (ලකුණු 20)

03. ශ්‍රී ලංකාවේ චන්ද බලය ආරම්භය හා විකාශනය පිළිබඳව 20 ශතවර්ෂයේ දේශපාලන ප්‍රතිසංස්කරණ ඇසුරින් විස්තර කරන්න. (ලකුණු 20)

04. 1931 ඩොනමෝර් ආණ්ඩු ක්‍රමය යටතේ ක්‍රියාත්මක වූ "විධායකකාරක සභා" දේශීය ව්‍යවස්ථාදායක නියෝජිතයින්ගේ දේශපාලන අත්දැකීම් වර්ධනය වීමට හේතු වූ ආකාරය විග්‍රහ කරන්න. (ලකුණු 20)

05. "1947 සොල්බරි ආණ්ඩු ක්‍රමය 'වෙස්ට්මින්ස්ටර් සම්ප්‍රදාය' මත නිර්මාණය කොට තිබුණි." මේ පිළිබඳව ඔබගේ අදහස් දක්වන්න. (ලකුණු 20)

06. 1972 පළමුවන ජනරජ ව්‍යවස්ථාව තුළින් හඳුන්වා දී තිබූ "ද්විත්ව විධායකය" පැහැදිලි කරන්න. (ලකුණු 20)

07. "ජාතික රාජ්‍ය සභාව ජනතා පරමාධිපත්‍යය ඉහළින්ම ප්‍රකාශයට පත්කර තිබුණි." මේ ප්‍රකාශය පිළිබඳව ඔබගේ අදහස් දක්වන්න. (ලකුණු 20)

08. ශ්‍රී ලංකාවේ 1978 දෙවන ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ පහත සඳහන් ක්‍රියාදාමයන් හා බැඳුණු ව්‍යවස්ථා ප්‍රතිපාදන විස්තර කරන්න.

    අ) ජනාධිපතිවරයා ධූරයෙන් ඉවත් කිරීම (ලකුණු 10)

    ආ) අනුප්‍රාප්තික ජනාධිපතිවරයා (Succeeding President) තෝරාපත්කරගැනීම (ලකුණු 10)

09. 1978 ශ්‍රී ලංකාවේ දෙවන ජනරජ ව්‍යවස්ථාව යටතේ පහත සඳහන් මාතෘකා දෙක පිළිබඳව සටහන් ලියන්න.

    අ) සහතික කරන ලද මූලික අයිතිවාසිකම් (ලකුණු 10)

    ආ) අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ යාන්ත්‍රණය (ලකුණු 10)

******************************